**ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය 2013**
**--------------------------------------------------**

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ක්‍රියාකාරිත්ව ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ1981 අංක 74 දරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල පනතේ 38 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරනලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළයුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**
**--------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවනඅභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**
**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට ( ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීමවිගණකගේ විනිශ්වය මත පදනම් වේ.එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරි බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**--------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2.** **මූල්‍ය ප්‍රකාශන**

**2.1** **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලටඅනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු වන බව මා දරන්නා වූ මතය වේ.

**2.2** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1** **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 අනුව දැනට භාවිතයට ගන්නා නමුත්, සම්පූර්ණයෙන් ක්ෂය කල පිරිවැය රු.2,193,737 ක් වූ දැව භාණ්ඩ හා උපකරණ ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කර නොතිබුණු අතර, එම වත්කම්වල දළ ධාරන අගය හෙළිදරව් කර නොතිබුණි.

**2.2.2** **ගිණුම්කරණ අඩුපාඩු**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට භෞතික ශේෂය රු.394,568ක් වූ ප්‍රකාශන තොගය මූල්‍ය ප්‍රකාශන තුල රු.506,416 ක් ලෙස දැක්වීම හේතුවෙන් ජංගම වත්කම් රු.111,848 කින් අධි තක්සේරු වී තිබුණි.

**2.2.3** **විගණනය සඳහා සාක්ෂි නොවීම**

උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ XX වැනි පරිච්ඡේදයේ 3 ඡේදය පරිදි අධ්‍යයන කාර්ය මණ්ඩලය වෙනුවෙන් පැමිණීමේ හා පිටවීමේ වාර්තා පවත්වාගෙන නොයාම හේතුවෙන් ඔවුනට ගෙවා තිබූ එකතුව රු.54,449,743ක වැටුප් හා දීමනා තහවුරු කර ගැනීමට නොහැකි විය.

**2.3** **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

සමාලෝචිත වර්ෂයේ කොන්ත්‍රාත්මත රඳවා ගැනීම්වල වටිනාකම රු.11,971,616ක් වූ අතර එයින් වර්ෂ 05 ඉක්මවූ රඳවා ගැනීම්වල එකතුව රු.9,635,190 ක් විය.

**2.4** **නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

පහත සඳහන් නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් නිරීක්ෂණය කරනු ලැබේ.

| **නීතිරීති රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම්** |
|---|---|
| (අ)ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේමුදල් රෙගුලාසි සංග්‍රහයේ 371(2) | ලබාදිය හැකි උපරිම අත්තිකාරම් මුදල ඉක්මවා2013 නොවැම්බර් මාසය තුළදී අවස්ථා දෙකකදී නිලධාරියෙකු වෙත රු.500,000 බැගින් අත්තිකාරම් ලබාදී තිබූ අතර, 2014 මැයි 31 වන විටත් මෙම අත්තිකාරම් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ආ) 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය | සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට මුදල් ගෙවීමේදී අධ්‍යයන දීමනාව සැලකිල්ලට ගැනීම හේතුවෙන් 1997 වර්ෂයේ සිට 2011 අගෝස්තු දක්වා රු.4,155,912ක් වැඩිපුර ගෙවා තිබුණි. |

**2.5 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**
-----------------------------------------------------------------

විශ්වවිද්‍යායේ පාලක සභා සාමාජිකයන්ට හා සනාතන සභා සාමාජිකයින්ට සභාවාරවලට පැමිණීම වෙනුවෙන් 2011 සැප්තැම්බර් 15 දිනැති රාජ්‍ය ව්‍යාපාරචක්‍රලේඛ අංක 58(2) ප්‍රකාරව ලබා දියහැකි දීමනාවලට අමතරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේXIV පරිච්ඡේදයේ 8.2 වගන්තිය ප්‍රකාරව සැතපුම් කුලිය සැලකිල්ලට නොගෙන ආයතනඅධ්‍යක්ෂකගේ අනුමැතියකින් තොරව රු.1,500 සිට රු.10,000 දක්වා ප්‍රවාහන දීමනාවක් ලබාදී තිබූ අතර, 2013 වර්ෂය සඳහා එලෙස ලබාදී ඇති ප්‍රවාහන දීමනාවල වටිනාකම රු.363,200 ක් විය.

**3. මූල්‍ය සමාලෝචනය**
-----------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**
--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලය වැඩ කටයුතු වල මූල්‍ය ප්‍රතිඵලය රු.2,300,007 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.10,184,520 ක් වූයෙන් ඌනතාවය රු.7,884,513 කින් අඩුවී තිබුණි. සමාලෝචිත වර්ෂයේ වියදම් සඳහා රජයේ ආධාර රු.15,422,120 ක් වැඩියෙන් ලැබීම සහ මූලධන ප්‍රතිපාදනය රු.42,941,704 කින් ලියාහැරීම ඌනතාවය අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3.2 ආයතනයට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි**
-----------------------------------------------------------------

ආයතනයේ සේවකයින් 02 දෙනෙකු විසින් සේවයෙන් ඉවත්කිරීමට විරුද්ධව ආයතනයට එරෙහිව අධිකරණවල නඩු 03 ක් හා එක් සේවකයෙකු කම්කරු දෙපාර්තමේන්තුවේ නඩුවක් පවරා ඇත.

**4. මෙහෙයුම් සමාලෝචනය**
-----------------------------

**4.1 කාර්ය සාධනය**
------------------

සමාලෝචිත වර්ෂය තුළ පැය 50 සිට පැය 164 දක්වා පරාසයක දේශකවරුන් 10 දෙනෙකු දේශන පවත්වා නොතිබූ බව නිරීක්ෂණය විය.

**4.2 ඒක ශිෂ්‍ය පිරිවැය**
--------------------

සමාලෝචිත වර්ෂය තුළ අධ්‍යයන කටයුතු සඳහා ශිෂ්‍යයින් 333 ක් වෙනුවෙන් දරන ලද මුළු පුනරාවර්තන වියදම් රු.190,592,915 ක් වූ අතර, ඉකුත් වර්ෂයේ ශිෂ්‍යයින් 359ක් වෙනුවෙන් දරන ලද මුළු පුනරාවර්තන වියදම රු.185,334,934 ක් විය. සමාලෝචිත වර්ෂයේ රු.572,351 ක් වූ ඒක ශිෂ්‍ය පිරිවැය ඉකුත් වර්ෂයේ රු.516,253ක් වූ ඒක ශිෂ්‍ය පිරිවැය හා සසඳන විට 10.86 % කින් වැඩි වී තිබුණි.

**4.3 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2009 මාර්තු 22 දින අභ්‍යන්තර විගණක ඉල්ලා අස්වී තිබූ අතර, එදිනට ඔහුගේ මූලික වැටුප රු.41,840ක් විය. පාරිතෝෂික මුදල් ගණනය කිරීමේදී මූලික වැටුප රු.25,145ක් ලෙස යොදා ගැනීම හේතුවෙන් කම්කරු විනිශ්චය සභාවේ තීරණය මත රු.76,302 ක අධිභාරයක් ගෙවීමට සිදුවී තිබුණි. එහෙත් ඒ සඳහා වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ආ) නිවැරදි තාක්ෂණික ඇගයීමකින් තොරව පිරිවැය රු.58,140 ක් වූ Bubble Jet Printer 17ක් 2011 දෙසැම්බර් 31 දින මිලදීගෙන තිබූ අතර, එම මුද්‍රණ යන්ත්‍රයක් තුළින් පිටපතක් ලබාගැනීම සඳහා රු.25කට අධික වියදමක් දරනු ලැබේ. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී පමණක් පරිගණක මුද්‍රණ යන්ත්‍ර සඳහා රු.290,000 ක Cartridgeමිලදී ගෙන තිබුණි.

(ඇ) භාණ්ඩාගාර අනුමැතියකින් තොරව විශ්වවිද්‍යාලය මඟින් පවත්වන බාහිර පාඨමාලා තුලින් ලැබෙන ලාභය තුළින් නිලධාරීන් 24 දෙනෙකුට දීමනාවක් ගෙවීමට ඇස්තමේන්තු කර තිබුණි. භාණ්ඩාගාර අනුමැතියකින් තොරව 2013 වර්ෂය තුළදී පවත්වනු ලැබූ බාහිර පාඨමාලා 4 කින් රු.1,976,400 ක දීමනා ගෙවා තිබුණද දීමනා ගෙවීමට ප්‍රමාණවත් අතිරික්තයක් බිහිකර නොමැති බව නිරීක්ෂණය විය.

(ඈ) වර්ෂය තුළ බාහිර පාඨමාලා 2ක් රු.259,644 ක අලාභයක් සහිතව පවත්වාගෙන ගොස් තිබුණු අතර, ඉන් එක් පාඨමාලාවක් වූ බෞද්ධ උපදේශන පාඨමාලාව සඳහා කිසිදු අයකිරීමක් සිදු කර නොතිබුණි.

**4.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) බෞද්ධ අධ්‍යයනයට හා පාලි භාෂාවට පමණක් සීමා වූ පර්යේෂණ වලට ආධාර කිරීම සඳහා පිහිටුවා තිබූ ජියුන් බෞද්ධ පර්යේෂණ හා ප්‍රකාශන අරමුදල 2006 වර්ෂයෙන් එහි අරමුණු ඉටුකර ගැනීම සඳහා යොදවා නොතිබූ අතර, සමාලෝචිත වර්ෂය අවසානයේදී අරමුදලේ ශේෂය රු.1,978,789ක්විය.

(ආ) 2013 වර්ෂය තුළ පුස්තකාල පොත් සමීක්ෂණය සඳහා කමිටුවක් පත් කර තිබූ අතර, එම කමිටු වාර්තාවට අනුව පුස්තකාල පොත් 4224 ක ඌනතාවයක් නිරීක්ෂණය විය.

**4.5 ඌන උපයෝජිත වත්කම්**

2004 වර්ෂයේ දී රු. මිලියන 512 ක් වැය කර සියලු පහසුකම් සහිතව නවීකරණය කරන ලද ගොඩනැගිලි ඇතුලු යටිතල පහසුකම් වැඩිදියුණු කර තිබුණද ඊට සාපේක්ෂව සිසුන් වැඩි සංඛ්‍යාවක් බඳවා ගැනීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදී සිසුන් 379 දෙනෙකු ඉල්ලුම් කළද බඳවා ගෙන තිබුනේ සිසුන් 107 දෙනෙකු පමණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

---

### 5.1 සංයුක්ත සැලැස්ම

---

2013-2017 සංයුක්ත සැලැස්මෙන් හා 2013 ප්‍රසම්පාදන සැලැස්මෙන් වර්ෂය තුළ ගොඩනැගිලි ව්‍යාපෘති 07 ක් වෙනුවෙන් වැය කිරීමට අපේක්ෂිතව තිබූ රු. මිලියන 52.3 න් සමාලෝචිත වර්ෂය තුළදී රු. මිලියන 16.63ක් පමණක් වැය කර තිබුණි. එය අපේක්ෂිත වියදමින් සියයට 31.79කි. එසේම ව්‍යාපෘති 05 ක් වෙනුවෙන් රු. මිලියන 25.25කට ඇස්තමේන්තු කර තිබූ සමාලෝචිත වර්ෂය තුළදී කිසිදු කාර්යයක් සිදුකර නොතිබුණි. තවද 2013 ප්‍රසම්පාදන සැලැස්මෙන් හදිසි ඉදිකිරීම් ලෙස දක්වා තිබූ යෝග භාවනා මධ්‍යස්ථානයේ ඉදිකිරීම් ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලන

---

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ මහෝපාධ්‍යානන් වහන්සේගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

(අ) වත්කම් කළමනාකරණය
(ආ) මානව සම්පත් කළමනාකරණය
(ඇ) බාහිර ව්‍යාපෘති වලට අදාළ ගිණුම්කරණය
(ඈ) වාහන පාලනය